සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම
**Second term Evaluation** - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / **Paper** I | කාලය / காலம் / **Time** පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ක්‍රිස්තු වර්ෂ පස්වන හෝ හයවන සියවසේ දී රචනා කරන ලදැයි සැලකෙන දේශීය සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ මින් කුමක් ද?
(1) දීපවංසය (2) මහාවංසය (3) දාඨාවංසය (4) බෝධිවංසය

(02) ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා දේශපාලන ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍රය වන්නේ,
(1) රාජාවලිය (2) පූජාවලිය (3) නිකාය සංග්‍රහය (4) සාරසංග්‍රහය

(03) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු හෙළිකර ගත හැකි මූලාශ්‍රය මින් කුමක් ද?
(1) මහාවංසය (2) ගොඩනැගිලි නටබුන්
(3) සෙල්ලිපි (4) ගල් මෙවලම්

(04) වංසකථාවල හා සෙල්ලිපිවල සඳහන් පරිදි "නියම්ගම්" නමින් හඳුන්වා ඇත්තේ,
(1) වෙළඳ ගම් ය. (2) ජනතාව විසින් අතහැර දැමූ වැව් ගම් ය.
(3) වරාය ආශ්‍රිතව තිබූ ගම් ය. (4) ගොවියන් විසූ ගම් ය.

(05) - ගමිකයන් අන් අයට පවා උදව් කළ හැකි තරමට ධනවත් පිරිසක් බව
- දෙමව්පියන් තමන්ගේ දියණිය සූප ශාස්ත්‍රයෙහි නිපුන කරවනු ලැබීම ඔවුන් සතු වගකීමක් බව
ඉහත සඳහන් කරුණු ඇතුළත් සාහිත්‍ය කෘතීන් දෙක පිළිවෙළින් සඳහන් වන පිළිතුර තෝරන්න.
(1) ජාතකට්ඨකථාව, දම්පියාඅටුවා ගැටපදය (2) රසවාහිනිය, සද්ධර්මාලංකාරය
(3) ජාතකට්ඨකථාව , සහස්සවත්ථුප්පකරණය (4) රසවාහිනිය , සද්ධර්මරත්නාවලිය

(06) ප්‍රධාන මාවත්වල ගව්වෙන් ගව්වට ගල් කණු සිටුවීම සහ හේන් වගාව වෙනුවෙන් අය කළ බදු අහෝසි කළ රජතුමා ලෙස සැලකෙන්නේ,
(1) හතරවන උදය රජතුමා (2) හතරවන කාශ්‍යප රජතුමා
(3) පළමුවන පරාක්‍රමබාහු රජතුමා (4) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා

(07) පළමුවන විජයබාහු රජතුමාගෙන් සිදුවූ සේවාව ඇගයීමේ දී ප්‍රමුඛත්වය දිය යුත්තේ මින් කුමන කරුණට ද?

(1) ඥාති සම්බන්ධතා මගින් අසල්වැසි රාජ්‍ය සමඟ සුහදව කටයුතු කිරීම.

(2) සොළී පාලනයෙන් මෙරට මුදාගෙන ස්වාධීන රාජ්‍යයක් බිහි කිරීම.

(3) අභාවයට ගොස් තිබූ වාරිමාර්ග වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

(4) පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා වීම.

(08) පුරාණ වෙළඳපලවල් සංවිධානාත්මකව පාලනය වූ බවට තොරතුරු ලැබෙන හොඳම නිදසුනක් වන්නේ,

(1) බුද්ධන්නෙහෙල සෙල්ලිපියයි. (2) කොත්ගල්කන්දේ සෙල්ලිපියයි.

(3) මිහින්තලා පුවරු ලිපියයි. (4) සොරබොරවැව ටැම් ලිපියයි.

(09) පියාගෙන් පුතාට රජකම උරුම වීමේ සම්ප්‍රදාය අනුව රාජ්‍යත්වයට පත්වූ රජවරු ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වසභ රජතුමා - වංකනාසිකතිස්ස රජතුමා

(2) දුටුගැමුණු රජතුමා - සද්ධාතිස්ස රජතුමා

(3) පළමුවන කාශ්‍යප රජතුමා - මුගලන් රජතුමා

(4) පළමුවන විමලධර්මසූරිය රංතුමා - සෙනරත් රජතුමා

(10) සෙල්ලිපිවල "සභාව" යන පදයෙන් අදහස් කර ඇත්තේ,

(1) ව්‍යවස්ථාදායකයයි. (2) විධායකයයි.

(3) අධිකරණයයි. (4) රාජසභාවයි.

(11) වසභ රජතුමා සම්බන්ධ පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් නොගැළපෙන වගන්තිය තෝරන්න.

(1) සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට විශේෂ රෝහලක් ඉදි කළේ ය.

(2) ලම්බකර්ණ වංසයේ ආරම්භක පාලකයා ය.

(3) මෙරට පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීමට උත්සාහ කළේ ය.

(4) විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීමේ පුරෝගාමියා ය.

(12) ඉතා සියුම් බෑස්මක් සහිත ඇළ මාර්ග ඉදිකිරීමට අතීත වාරි ශිල්පීන් සමත් වූ බවට දිය හැකි හොඳම නිදසුන වන්නේ මින් කුමක් ද?

(1) අංගමැඩිල්ල ඇළ (2) යෝධ ඇළ (3) මිනිපේ ඇළ (4) ඇළහැර ඇළ

(13) හයවන අග්ගබෝධි රජු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) කාලිංග දේශය සමඟ ඥාති සබඳතා ඇතිකර ගැනීම.

(2) චේර රාජ්‍ය සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම.

(3) චීනය සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත්වීම.

(4) රෝමානුක දේශය සමඟ වෙළඳ සබඳතා ඇතිකර ගැනීම.

(14) අතීතයේ දී වැව්වල ජලය භාවිතා කිරීම වෙනුවෙන් රජයට අයකල බද්ද හැඳින්වූයේ කුමන නමකින් ද?

(1) බොජකපති (2) දකපති (3) කෙටුකනබ (4) මතරමජිබක

(15) අතීතයේ දී කිරිය, අමුණ, කරීසය යන මිනුම් භාවිතා කළේ කුමක් සඳහා ද?

(1) බර මැනීමට ය. (2) දිග මැනීමට ය.

(3) කාලය මැනීමට ය. (4) අවකාශය මැනීමට ය.

(16) පහත දැක්වෙන කාර්යයන් අතුරෙන් දෙවැනි පරාක්‍රමබාහු රජුගේ කාර්යයන් ඇතුළත් පිළිතුර කුමක් ද?

A - දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම.

B - බෙලිගල දළදා මැඳුරක් ඉදි කිරීම.

C - සපුමල් කුමරු යවා යාපනය ජය ගැනීම.

D - කාලිංග මාඝ පරාජයට පත් කිරීම.

(1) B හා D (2) C හා D (3) A හා D (4) A හා C

(17) පහත සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය ලියැවුණු රාජධානි යුගයන් සමඟ නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. ගුත්තිල කාව්‍යය | A. දඹදෙණි යුගය |
| 2. සද්ධර්මාලංකාරය | B. කුරුණෑගල යුගය |
| 3. සිදත් සඟරාව | C. ගම්පොල යුගය |
| 4. දළදා සිරිත | D. කෝට්ටේ යුගය |

(1) ACDB (2) DCAB (3) CDBA (4) CDBA

(18) ක්‍රි.ව. 1638 හා ක්‍රි.ව. 1766 ගිවිසුම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) උඩරට රජවරු පෘතුගීසීන් සමඟ අත්සන් කළ ගිවිසුම් ය.

(2) උඩරට රජවරු ලන්දේසීන් සමඟ අත්සන් කළ ගිවිසුම් ය.

(3) පෘතුගීසීන් යාපන රාජධානියේ පාලකයන් සමඟ අත්සන් කළ ගිවිසුම් ය.

(4) උඩරට රාජධානියේ ප්‍රභූවරු ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු සමඟ අත්සන් කළ ගිවිසුම් ය.

- **පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් 19 සහ 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - පළමුවන විමලධර්මසූරිය රජු උඩරට රාජ්‍යත්වයට පත්වීම.

B - හයවන විජයබාහු රජුට විරුද්ධව විජයබා කොල්ලය ඇතිවීම.

C - මුල්ලේරියා සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත්වීම.

D - සේනාසම්මත වික්‍රමබාහු උඩරට පාලකයා වීම.

(19) ඉහත සිදුවීම් ඓතිහාසික අනුපිළිවෙළ අනුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) DCAB (2) BACD (3) DBCA (4) CBDA

(20) C අක්ෂරයෙන් දැක්වෙන සටන මෙහෙයවූ ටිකිරි කුමරු රාජ්‍යත්වයට පත්වීමෙන් පසු හැඳින්වූ නම කුමක් ද?

(1) පළමුවන රාජසිංහ රජු (2) දෙවන රාජසිංහ රජු

(3) හයවන බුවනෙකබාහු රජු (4) කරල්ලියැද්දේ බණ්ඩාර රජු

(21) පෘතුගීසීන් යාපනය රාජධානිය යටත් කර ගැනීමට උනන්දු වූ කරුණක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) යාපනය හා උඩරට පාලකයන් අතර පැවැති සම්බන්ධතා වැළැක්වීමට

(2) යාපන ප්‍රදේශයේ කතෝලික ආගම් ප්‍රචාරයට පැමිණි බාධක ඉවත් කිරීම

(3) මුලු දිවයිනේම කුළුබඩු ඒකාධිකාරය ලබාගැනීමට

(4) උතුරු ප්‍රදේශයෙන් වරායක් ලබාගැනීමට

- **පහත සඳහන් වගුවේ A සිට J දක්වා තොරතුරු ඇසුරින් 22, 23 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | ආණ්ඩුකාරවරු | ඓතිහාසික පුද්ගලයෝ |
|---|---|---|
| A - 1795 | D - රොබට් බ්‍රවුන්රිග් | G - ජෝන් ඩොයිලි |
| B - 1803 | E - ප්‍රෙඩ්රික් නෝර්ත් | H - මැක්ඩෝවල් |
| C - 1818 | F - ෆන් එංගල්බෙක් | J - පස්වන විලියම් |

(22) ශ්‍රී ලංකාවේ ලන්දේසි බලකොටු ඉංග්‍රීසීන් වෙත පවරා ගැනීම පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) BDG (2) AFJ (3) AEJ (4) BFH

(23) උඩරට ඉංග්‍රීසීන් යටත්කර ගැනීමට පෙර සිදුවූ සටනක් පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) BEH (2) ADH (3) AEG (4) BDG

(24) ඉංග්‍රීසීන්ට උඩරට රාජධානිය අල්ලා ගැනීමට පහසු වූ ප්‍රධානම සාධකය වූයේ,

(1) සිංහල රදළ ප්‍රධානින්ගේ වරප්‍රසාද අහිමි කිරීම ය.

(2) රදළ ප්‍රධානීන් සහ ජනතාව තුළ තිබූ රාජපාක්ෂික බව හීන වී යාම ය.

(3) උඩරට රජු විසින් ක්‍රියාත්මක කළ ඉතා අමානුෂික දඬුවම් ය.

(4) ඇහැලේපොල අධිකාරම් ඉංග්‍රීසින්ට පක්ෂපාතීව කටයුතු කිරීම ය.

(25) අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කරගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ,

(1) අනගාරික ධර්මපාලතුමා (2) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

(3) පියදාස සිරිසේන මහතා (4) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා

(26) - යාපනයේ ශිවන්ගල විද්‍යාලය

- කොළඹ සහිරා විද්‍යාලය

ඉහත සඳහන් පාසල් පිහිටුවීමේ පුරෝගාමීන් පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) ආරුමුග නාවලර්තුමා . සිද්දිලෙබ්බෙ මහතා

(2) පොන්නම්බලම් අරුණාචලම් මහතා, සිද්දිලෙබ්බේ මහතා

(3) ආරුමුග නාවලර්තුමා . ටී. බී. ජයා මහතා

(4) පොන්නම්බලම් අරුණාචලම් මහතා, ටී. බී. ජයා මහතා

- **පහත A සිට F දක්වා ඇති තොරතුරු ඇසුරින් 27 - 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම
B - ජනමත විචාරණය හඳුන්වාදීම
C - දිවයින පළාත් පහකට බෙදීම
D - අධිකරණ සේවා කොමිසම පිහිටුවීම
E - නාමික විධායක ජනාධිපති තනතුර
F - මෙරට ශ්‍රී ලංකාව යන නාමයෙන් හැඳින්වීම

(27) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සම්බන්ධ තොරතුරු දෙකක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) C හා D (2) A හා C (3) D හා E (4) A හා E

(28) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා D (2) A හා E (3) D හා F (4) E හා F

(29) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) B හා E (2) A හා B (3) D හා F (4) A හා D

(30) - කෝපිවලට අයකළ අපනයන බද්ද අඩු කිරීම.
- ප්‍රථම වරට කෝපි කෙටීමට මෝලක් ඇරඹීම.
කෝපි වගාව හා සම්බන්ධ ඉහත කාර්යයන් ඉටුකළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ප්‍රෙඩ්රික්නෝර්ත්, රොබට් බ්‍රවුන්රිග් (2) තෝමස් මෙට්ලන්ඩ්, එඩ්වඩ් බාන්ස්
(3) ප්‍රෙඩ්රික්නෝර්ත්, හෙන්රිවෝඩ් (4) එඩ්වඩ්බාන්ස්, ප්‍රෙඩ්රික්නෝර්ත්

(31) මෙරට වෘත්තීය සමිති ව්‍යාපාරයේ කැපී පෙනෙන අවස්ථාවක් ලෙස ලංකා කම්කරු සංගමය පිහිටුවීමේ පුරෝගාමියා වූයේ,
(1) නටේසර් අයියර් මහතා ය. (2) එන්.එම්.පෙරේරා මහතා ය.
(3) එස්. ඒ. වික්‍රමසිංහ මහතා ය. (4) ඒ. ඊ. ගුණසිංහ මහතා ය.

(32) 20වන සියවසේ දී මෙරට දේශපාලන උද්ඝෝෂණ ව්‍යාපාරවල පෙරමුණ ගන්නා ලද්දේ,
(1) පැරණි ප්‍රභූ පන්තියයි. (2) උගත් මධ්‍යම පන්තියයි.
(3) නාගරික හා වතු කම්කරු ජනතාවයි. (4) මහජන එක්සත් පෙරමුණේ නායකයන් ය.

(33) 1953 දී වාමාංශික පක්ෂ විසින් මෙහෙයවන ලද හර්තාල් ව්‍යාපාරයක් නිසා අගමැති තනතුරෙන් ඉල්ලා අස්වූ නායකයා කවුරුන් ද?
(1) ඩී.ඇස්.සේනානායක මහතා (2) ඩඩ්ලි සේනානායක මහතා
(3) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා (4) ජෝන් කොතලාවල මහතා

(34) නිදහස ලැබීමට පෙර මෙරට ආරම්භ කළ ගොවිජන පද ව්‍යාපාර ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ගල්ඔය, කන්තලේ, සොරබොර වැව (2) ගිරිතලේ, ගල්ඔය, කන්තලේ
(3) මින්නේරිය, මිනිපේ, නාච්චදූව (4) දේවහුව, ඉරණමඩු, ගල්ඔය

(35) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර ආරම්භ කරන ලද්දේ,

(1) පොල්ගොල්ලේ දී මහවැලි ගඟ හරහා වේල්ලක් බැඳීමෙන් ය.

(2) වියලි කලාපයේ ගොවිජනපද පිහිටුවීමෙන් ය.

(3) කොත්මලේ ජලාශය ඉදිකිරීමෙන් ය.

(4) රන්දෙනිගල ජලාශය ඉදිකිරීමෙන් ය.

(36) සුළු අපනයන බෝග වගාව දියුණු කිරීම උදෙසා පර්යේෂණ ආයතනය පිහිටි ප්‍රදේශය වන්නේ,

(1) අගලවත්ත (2) ලුණුවිල (3) නුවරඑළිය (4) මාතලේ

(37) ජෝන් වයික්ලිප්, ජෝන්හස්, මාටින් ලූතර් යන පුද්ගලයන් වැදගත් වන්නේ පහත සඳහන් කවර කරුණු සම්බන්ධයෙන් ද?

(1) ආගමික ප්‍රතිසංස්කරණ සඳහා මූලිකත්වය ගැනීම

(2) දේශ ගවේෂණ ගමන් සඳහා අනුග්‍රහය දැක්වීම

(3) පුනරුද සමයේ වැදගත් සාහිත්‍ය කෘති රචනා කිරීම

(4) පුනරුද සමයේ ජාතික රාජ්‍ය බිහිකිරීමට මූලිකත්වය ගැනීම

(38) පුනරුද සමයේ චිත්‍ර ශිල්පියකු පමණක් නොව කවියකු, සංගීතඥයකු, විද්‍යාඥයකු මෙන්ම ප්‍රායෝගික ඉංජිනේරුවෙක් වශයෙන් ප්‍රසිද්ධියට පත්වූයේ,

(1) මයිකල් ආංජිලෝ ය. (2) රෆායල් ය.

(3) ලියනාඩෝ ඩාවින්චි ය. (4) ගැලිලියෝ ගැලලි ය.

(39) කාර්මික විප්ලවයේ ප්‍රබෝධයක් ලෙස පේෂ කාර්මාන්තයේ දියුණුව උදෙසා නිපැයුම් කළ පුද්ගලයින් පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) හෙන්රිකෝට්, ඒබ්‍රහම් ඩර්බි (2) තෝමස් නිව්කොමන්, හම්ප්‍රි ඩේවි

(3) විලියම් සීමන්ස්, සැමුවෙල් මෝස් (4) රිචඩ් ආරක්රයිට්, සැමුවෙල් ක්‍රොම්ප්ටන්

(40) කාර්මික විප්ලවයේ සමාජ ක්ෂේත්‍රය තුළ ඇති කළ බලපෑමක් වූයේ,

(1) පන්ති සහිත සමාජයක් බිහිවීම ය.

(2) ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳවැටීම

(3) බහුජාතික සමාගම් හා බැංකු ආරම්භවීම ය.

(4) සේවක වැඩ වර්ජන හා අයිතිවාසිකම් සඳහා සටන් කිරීම ය.